# අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින ගබඩා භාරකරු III ශ්‍රේණිය තනතුර සඳහා 2015.06.12 දින දක්වා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ගබඩා භාරකරු III ශ්‍රේණිය**

සුදුසුකම් : (I) (අ). අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ ගණිතය / අංක ගණිතය / වාණිජ අංක ගණිතය යන විෂයයන් ඇතුලුව විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත්වීම

හෝ

(ආ). අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය / අංක ගණිතය / වාණිජ අංක ගණිතය යන විෂයයන් ඇතුලුව විෂයයන් 06 කින් සමත්ව විශ්වවිද්‍යාල සේවයේ අවුරුදු 05 ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(II) **ගබඩාකරණය පිළිබඳ පළපුරුද්ද සහ අ.පො.ස. (සා/පෙ) විභාගයේ දී ගණකාධිකරණය විෂය සමත්ව තිබීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ.**

වයස : අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

සටහන : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතන විසින් තීරණය කරනු ලබන පරිදි ඇප මුදල් තැන්පත් කළ යුතුය.

වැටුප් පරිමාණය : U-MN-1 (III A)
(Rs. 16,070 - 17x155 - 18,705/-) - (මාසික)

බඳවාගැනීම : ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය පදනම් කරගනිමින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

**සේවා කොන්දේසි :**

තෝරාගනු ලබන අයදුම්කරු පත්වීම් ලද දින සිට වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

විශ්වවිද්‍යාල සේවයේ / රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු තම ඉපැයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපැයීම් වලින් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුපට ද, 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට ද බැරකරනු ලැබේ. එයට අමතරව 3% මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවක භාරකාර අරමුදලට බැරකරනු ලැබේ.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

* අයදුම්කරුවන් පීව දත්ත තොරතුරු ඇතුලත් වන සේ තමන් විසින් සකස්කරගත් අයදුම්පත් අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත් ද සමග සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ. යන ලිපිනයට 2015.06.12 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
* විශ්වවිද්‍යාල සේවයේ / රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
* අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.
* අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**

**2015.05.21**